බුදු සමයෙහි එන බුදුවරු

ජේ. බී. දිසානායක

පෙරදිග කැටයම් කලාවෙහි නිරූපිත බුදු පිළිමයෙහි උපත හා වැඩීම හඳුරන පුරාවිද්‍යාඥයන් හා කලා විචාරකයන් ''බුද්ධ'' යන පදය විවරණය කරනු ලබන්නේ ථෙරවාදී බෞද්ධ ආචාර්‍යවරයන් ඒ පදය විග්‍රහ කරනවාට වඩා පළල් අර්ථයකිනි. පාළි බෞද්ධ සාහිත්‍යයෙහි එන ''බුද්ධ'' යන පදය, සත්‍යය අවබොධ කොට ගත් තැනැත්තා යන අරුත් නහයි. මෙය හීනයානිකයන්ට මෙන් ම මහායානිකයන්ට ද පොදු අර්ථ විග්‍රහයක් වශයෙන් සැලකිය හැකි ය. එහෙත් ආදි හීනයානිකයන් නො අනුදත් අර්ථයකින් ද මහායානිකයෝ ''බුද්ධ'' යන පදය වහරන්නට වූහ. මේ අර්ථය හින්දු සමයෙහි ප්‍රභාව ලබමින් වැඩුණක් බව පැහැදිලිව පෙනෙන්නට තිබේ. ''බුද්ධ'' යන පදයෙහි අර්ථය කෙරෙහි හින්දු සමයෙහි ආභාසය තවත් අංශයකින් විහිදෙන ආකාරය වටහා ගැනීමට විෂ්ණු දෙවියන්ගේ දස අවතාර පිළිබඳ පුවත අපට අනුබල දෙයි, මෙසේ කල් යත් යත් ම, නොයෙක් ආචාර්‍ය පරම්පරා හා සම්‍යාන්තර ඕස්සේ විහිද යමින් ඇතිවුණු ''බුද්ධ'' අර්ථ විකාශනය, බුදු පිළිමයෙහි සම්භවය හා පරිණාමය සමඟ ඉතා දැඩි ලෙස බැඳි පවතී. එබැවින් ''බුද්ධ'' යන පදයෙහි ගැබ් වී ඇති නොයෙක් අර්ථ ප්‍රභේද සලකා බැලීම, බුදු පිළිමයෙහි විවිධ මුහුණුවර හඳුනාගැනීමට උපකාරී වෙයි.

පාළි ත්‍රිපිටකයෙහි ''බුද්ධ'' යන පදය භාවිතා කොට ඇත්තේ සිවුසස් අවබොධ කොට ගත් තැනැත්තා යන පොදු අර්ථයෙනි. මහානිද්දේස-පාළියෙහි ''කෙනට්ඨෙන බුද්ධො?'' යන ප්‍රශ්නය විවරණය කොට ඇත්තේ මෙසේය:[1]

> ''බුජ්ඣිතා සච්චානීති බුද්ධෝ..... විමොක්ඛන්ති මෙතං බුද්ධානං භගවන්තානං බොධියා මූලෙ සහ සබ්බඤ්ඤුතඤාණස්ස පටිලාභා සච්ඡිකා පඤ්ඤත්ති යදිදං බුද්ධොති'' (කථව

අර්ථයකින් ''බුද්ධ'' නම් වීද යත්. සිවුසස් අවබොධ කළ හෙයින් බුද්ධ ය. භාග්‍යවත් බුදුවරයනට යම් ''බුද්ධ'' යන නාමයක් වේ නම් අර්හත් ඵලයාගේ අන්තයෙහි උපන් ඒ නාමය, මහබෝ මැඩ දී සර්වඥතා ඥනයාගේ ප්‍රතිලාභය සමඟ අර්හත් ඵලය ප්‍රත්‍යක්ෂ කිරීමෙන් උපන් ප්‍රඥප්තියකි.''

''බුද්ධ'' යන පදය, මෙසේ සර්වඥතා ඥනය ලබන පුද්ගලයින්ට ව්‍යවහාර කරනු ලබන ජාති නාමයක් විනා කිසියම් පුද්ගලයකු සඳහා යොදනු ලබන පෞද්ගලික සංඥානාමයක් නොවන බව ද මහානිද්දෙසපාළිය අවධාරනව ම සඳහන් කරයි.[2]

''බුද්ධොති නෙතං නාමං මාතරා කතං,
න පිතරා කතං.....''
(බුද්ධ යන ඒ නාමය, මැණියන් විසින් නොකරන ලද, පියාණන් විසින් නොකරන ලද.....'')

සත්‍ය අවබොධ කොට ගත් බුදුවරයින් අතුරෙහි ද, ''පච්චේක බුද්ධ'' හා ''සම්මා සම්බුද්ධ'' යනු විසින් දෙ-වැදෑරුම් ප්‍රභෙදයක් ත්‍රිපිටකය දක්වයි. පරොපදෙශ රහිතව සත්‍යය අවබොධ කොට ගෙන, අන්‍යයන්ගේ ද විමුක්තිය සඳහා සත්‍යය අවබොධ කරවීමෙහි අනුයෝගී නැනැත්තා ''සම්මා සම්බුද්ධ'' හෙවත් ''සබ්බඤ්ඤු බුද්ධ'' යන නමින් හැඳින්වේ. ස්වයම්භූ ඥානයෙන් සිවුසස් පසක් කොට ගත් නමුදු, එය ප්‍රජාවට අවබොධ කරවීමෙහි තත්පර නොවන නැනැත්තා ''පච්චෙක බුද්ධ'' හෙවත් ''පසේබුදු'' නම් වෙයි. මේ හැරුනු විට ''බුද්ධ'' යන පදය තවත් පුද්ගලයින් කිහිප දෙනෙකු අරභයා ද පාළි සාහිත්‍යයෙහි ව්‍යවහාර කොට තිබේ. කෙලෙස් මල බැහැර කළ රහත් තෙරවරුන් ''චතුසච්ච බුද්ධ'' යනුවෙන් ද, බහුශ්‍රැතයන් ''සුත බුද්ධ'' හෙවත් ''බහුස්සුත බුද්ධ'' යනුවෙන් ද මනොරථ පූරණයෙහි දැක්වේ.[3] එහෙත් මනොරථපූරණයෙහි එන මේ ප්‍රභෙදය, පසු කලක දී අට්ඨකථාචාරීන් විසින් නිපදවන ලද්දක් මිස ත්‍රිපිටක සාහිත්‍යයෙහි පැනෙන්නක් නොවන බව පෙනේ.

මොවුන් අතුරෙන්, සම්මා සම්බුදුවරයින් ලොව උපදින්නේ කාලාන්තරයකිනැයිද බෞද්ධ සාහිත්‍යයෙහි සඳහන් වී තිබේ. මෙවැනි සම්මා සම්බුදුවරයකු අවසාන වරට ලොව පහළ වූයේ ක්‍රිස්තු වර්ෂයට යට හවැනි සියවසෙහි උතුරු භාරතයෙහි ය. බුදු පිළිමයෙහි පරිනාමය දක්වන පුරාවිද්‍යාඥයින් හා කලා විචාරකයින් ''බුද්ධ'' යන පදය යොදන්නේ සත්‍යය අවබොධ කොට ගත් තැනැත්තා යන පොදු අර්ථය දැනවීමට වඩා භාරතීය ඉතිහාසයෙහි එක්තරා අවදියක ජීවත්වූහයි ඉතිහාසඥයින් විසින් පවසනු ලබන මේ පුද්ගලයා හඳුන්වනු පිණිස ය.

ගෞතම බුද්ධ

ගෞතම බුද්ධ චරිතයට පදනම් වූ ඓතිහාසික කරුණු නියම වශයෙන් ම වෙන් කොට හඳුනා ගැනීම දුෂ්කර කාර්‍යයකි. මේ කාර්‍යයෙහි නියැලුණු ඇතැම් නූතන විචාරකයෙක්, ගෞතම, බුදුන් ඓතිහාසික පුද්ගලයෙකැයි යන මතය මුළුමනින් ම බැහැර කෙළේ ය. තවත් කිසිවෙක් පශ්චාත්කාලීන ග්‍රන්ථවල දැක්වෙන බුද්ධ චරිතය මුළුමනින් ම ඓතිහාසික සත්‍යයක් ලෙස පිළිගත්හ. මේ සම්බන්ධයෙන් ආචාර්‍ය්‍ය කුමාරස්වාමි දක්වන මතය බෙහෙවින් සහේතුකය.

''බුදුන් ඉතිහාසය, පුරාණොක්තියක් නොවන බව කිව යුතු ය. ක්‍රිස්තුස් වහන්සේගේ චරිත කථාවට බීජ වූ ඓතිහාසික කරුණු වෙන් කොට දත හැකිවාක් සේ ම බුදුන් වහන්සේගේ චරිතාපදනයෙන් ද – ඓතිහාසික කරුණු තෝරා බෙරා ගත හැකි බව සැබෑ ය.''[4]

ඇතැම් විචාරකයකු ගෞතම බුදුන්ගේ චරිත කථාව හුදු පුරාණොක්තියක් වශයෙන් බැහැර කරන්නේ, සමහරුන් ඔහුගේ චරිතය ඓතිහාසික යුගයක විසූ සැබෑ පුද්ගලයකුගේ චරිතයකට වඩා දෙවියකු පිළිබඳ කථාවට ළං කිරීමට උත්සාහ කොට ඇති බැවිනි.

ගෞතම බුදුන්ගේ ජීවිත කථාව වටා නොයෙක් ප්‍රාතිහාර්‍යය, දේවකථා, ජනප්‍රවාද හා පුරාණොක්ති ආදිය ගෙතෙන්නට වූයේ මහායානික බෞද්ධයින් අතර වූ මහාසාංගිකයින්ගේ මතවාද නිසා බව ඇතැම් ලේඛකයෝ පෙන්වා දෙති! බුදුහු ''දේවාතිදේව'' බවට හෝ බ්‍රහ්මාතිබ්‍රහ්ම'' බවට පත් කිරීමට සිතූ මහාසාංගිකයෝ, උත්තරමානුෂිය ගුණාංගයන්ගෙන් බුද්ධ චරිතය පොෂණය කරනු වෙනුවට අතිමානුෂික පුරාණොක්තීන්ගෙන් හා දේවකථාවන්ගෙන් ඔහුගේ ජීවිත කථාව පිරවූහ. බුදුන්ගේ ධර්මකායත්, රූපකායත් එකක් ම යයි යන මතය දැඩිව ගත් ඔවුහු, ඓතිහාසික පුද්ගලයෙකු හැටියට ගෞතම බුදුන්ගේ ජීවන චරිතය කෙරෙහි එතරම් සැලකිල්ලක් යොමු නොකළහ. මේ ප්‍රයත්නයෙහි උපරිම අවස්ථාව, ''මහාවස්තු'' හෝ ''ලලිතවිස්තර'' වැනි මහායාන සංස්කෘත ග්‍රන්ථයන්ගෙන් මනාව ප්‍රකට වෙතියි විචාරකයෝ පවසති.!

ලක්දිව බෞද්ධයින් විසින් පවා ගෞතම බුදුන්ගේ ජීවිත කථාවට අතිමානුෂික ගුණ ආරූඪ කිරීමට වෑයමක් දරන ලදැයි ආචාර්‍ය අදිකාරම් පෙන්වා දෙයි.[7] ඔහු මෙසේ ද පවසයි: ''කිසියම් ශ්‍රේෂ්ඨ ආගමික ශාස්තෘවරයකු මිය ගිය කල්හි, ඔහුගේ අනුගාමිකයන් විසින් ඔහු තුළ පිහිටි හුදු මිනිස් ගතිගුණ අමතක කොට දමා, දේවත්වයෙන් පුදනු ලැබීම ස්වාභාවික ය. ඔවුන් මෙසේ කරන්නේ ඔවුන්ගේ ශාස්තෘවරයා කෙරේ පවතින දැඩි ගෞරව සම්ප්‍රයුක්ත භක්තිය හේතුකොට ගෙන ය. ශාස්තෘවරයෙකුට දේවත්වයක් ආරෝපණය කිරීම ස්වාභාවික සිද්ධියක් නිසා, ලක්දිව බෞද්ධයන් විසින් බුදුන්ගේ ජීවන චරිතයට නොයෙක් අතිමානුෂික ගුණ ආරූඪ කිරීමට දරන ලද උත්සාහය, ඇතැම් විට, දඹදිව පැවැති ලෝකොත්තරවාදීන්ගේ බලපෑමෙන් තොරව වුව ද මෙහි ඇතිවිය හැකි යයි සිතීමට පුළුවන.''

කෙසේ වුව ද සාහිත්‍යකරුවන් විසින් තම තමන්ගේ කවිත්වයෙන් ඔප්නංවන ලද විසිතුරු දේවකථාත්, අපූර්ව සිද්ධි හා ජනකථාත් බැහැර කිරීමෙන් පසු ශෙෂවන ඓතිහාසික තොරතුරු සැහෙන ප්‍රමාණයක් ත්‍රිපිටකයෙහි තිබේ. බුදුන්ගේ ඓතිහාසික ජීවිත කථාව සකස් කර ගැනීමට අදළ වන මෙබඳු පාඨ රාශියක් ආචාර්‍ය තෝමස් විසින් තමාගේ එක් ග්‍රන්ථයක සංග්‍රහ කොටතිබේ.[8] ත්‍රිපිටක සාහිත්‍යයෙහි එන එබඳු තොරතුරු අනුසාරයෙන් සකස් කොට ගත් ගෞතම බුද්ධ චරිතය මෙසේ සැකෙවින් දක්වාලිය හැකිය.

ගෞතම බුදුහු, ක්‍රි.ව. යට 563 වැනි අවුරුද්දෙහි,[9] උතුරු භාරතයෙහි කපිලවස්තු පුර සමීපයෙහි පිහිටි ලුම්බිනි නම් උයනෙහි උපත ලැබූහ. ඔහුගේ පියා සුද්ධොදන නම් සාක්‍ය වංශික රජ කෙනෙකි. ඔහුගේ මෑණියන් වූ මායා හෙවත් මහාමායා බිසව, ඔහු උපන් සත් දිනකින් මිය ගිය බව කියනු ලැබේ. ඔවුන්ගේ පරපුර ගෞතම ගොත්‍රයට අයත් වූ හෙයින් හෙතම ''ගෞතම සිද්ධාර්ථ'' යන නමින් ප්‍රකට විය. මහාවස්තුවෙහි ඔහුගේ නම සඳහන් වන්නේ ''ස්ර්වාර්ථසිද්ධ'' යනුවෙනි.[10] මොහුගේ ළදරු කාලය පිළිබඳ ඓතිහාසික තොරතුරු විරල ය. ඔහු දහසය වැනි වියෙහි දී යශොධරා[11] නම් කෝළිය වංශික කුමාරියක හා විවාහ වූයේ ය. දස අවුරුද්දකට පසු රාහුල නම් පුතෙක් ද ඔවුන්ට ලැබුණේ ය. රාහුල කුමරුන්ගේ උපත, සිද්ධාර්ථ කුමාරයන්ගේ ජීවිතයෙහි බලවත් විපර්‍යාසයකට තුඩු දුන් සිද්ධියක් ලෙස ගිණිය හැකි ය. මෙතෙක් කල් රාජකීය ජීවිතයට පුරුදුව සිටි සිදුහත් කුමරු ක්‍රමයෙන් තමා ගෙවන අලස අගාරික ජීවිතය කෙරෙහි කලකිරෙන්නට වූයේ ය.. ඔහු රාහුල කුමරුවන් දුටුවේ තමාත්, තමා ගෙවන නිසරු ජීවිතයත් එක්කොට බඳින යදමෙහි ශක්තිමත් පුරුකක් වශයෙනි. එබැවින් ඔහු, විසිනව වැනි වියෙහි දී, ජීවිතයෙහි සත්‍යය අවබොධ කරනු පිණිස, ගෘහ ජීවිතය අත්හැර අභිනික්මන් කෙළේ ය. මෙසේ සාවුරුද්දක් ඔහු රජගහනුවර බඳු තැන්වල විසූ ආචාර්‍යවරයන්ගෙන් සාංඛ්‍ය හා යොග දර්ශන ප්‍රගුණ කරමින් ද, තනිව ම කයට දුක් වේදනා පමුණුවාගනිමින් ද, සත්‍යය සෙවීමට වෙහෙස වුණේ ය. පසුව, ස්වකීය ශක්තියෙන් ම සත්‍යය අවබොධ කොට ගත් හෙතෙම ''බුද්ධත්වයට'' පත් වූයේ ය. අනතුරුව හතලිස් පස් වසක් අන්‍යයන්ගේ ද හිත සුව පිණිස, තමන් වටහා ගත් සත්‍යය අවබොධ කර දීමෙහි නියැළුණු බුදුහු, ක්‍රි.ව. යට 483 වැන්නෙහි දී 12 පමණ කුසිනාරා නුවර දී පිරිනිවන් පෑවේ ය. ඔහු, පිරිනිවන් පානවිට අසූ විය ඉක්ම වූ වයොවෘධ පුද්ගලයෙකි.

ශ්‍රද්ධාව පෙරටු කොට ගත් භක්තිමතුනුත්, කවිත්වයෙන් ඔද වැඩුණු සාහිත්‍යකරුවනුත්, බුදුන් දෙවියකු බවට පත් කිරීමට තැත් කළ ද, එතුමා අන් කවර පුද්ගලයකු වගේ ම මිනිස් ගුණයෙන් හෙබි චරිතයකැ යි නිගමනය කිරීමට තුඩු දෙන තොරතුරු ත්‍රිපිටකයෙන් ම වුව ලබා ගත හැකි ය. සංයුක්ත නිකායට අයත් ''ජරා සූත්‍රය,'' බුදුහු ද මනුෂ්‍ය ජීවිතයට පොදු අනිත්‍ය ස්වභාවය නොඉක්මවූවකු බව හෙළි කරන්නෙකි.[13] එතුමා සැවැත් නුවර සමීපයෙහි මිගාරමාතු ප්‍රාසාදයෙහි වැඩ සිටින සමයෙහි එක් දිනක් සවස් භාගයෙහි හිරු රැසින් පිට තවමින් සිටියේය. එතැනට පැමිණි ආනන්ද හිමියෝ, බුදුන්ගේ අත්පා මෙහෙවර කරමින් සිට, බුදුවරයින්ගේ පවා ශරීරය ජරාවට පත්වන ආකාරය දැක විස්මය පළ කළෝ ය. ආනන්ද හිමි මෙසේ කියයි: ''අච්ඡරියා භන්තෙ අබ්භුතභන්තෙන වෙව දනි භන්තෙ භගවතො තාව පරිසුද්ධො ඡවිවණ්ණො පරියොදතො සිථිලානි ච ගත්තානි සබ්බානි බලියජාතානි පුරතො පඛ්භාරො ච කායො දිස්සති ච ඉන්ද්‍රියාන ං අඤ්ඤථත්තං චක්ඛුන්ද්‍රියස්ස සොතොන්ද්‍රියස්ස සානින්ද්‍රියස්ස ජිව්හින්ද්‍රියස්ස කායින්ද්‍රියස්ස ති.'' (හිමියනි, ආශ්චර්‍යයි; හිමියනි අද්භූතය; හිමියනි, දැන් භාග්‍යවතුන් වහන්සේගේ සමෙහි පැහැය පෙර මෙන් පිරිසිදු නැත. පැහැපත් නැත. සියලු ශරීර අවයව ලිහිල්ව රැළි නැගී තිබේ. සිරුර ඉදිරියට නැමී ගොස් ඇත. ඇස, කණ, නැහැය, දිව, කය යන ඉඳුරන්ගේ වෙනස් බවත් දක්නට ලැබේ.)

ගෞතම බුදුන්ගේ මිනිස් ගතිගුණ ඉස්මතු කොට දක්වන මෙබඳු පුවත් රාශියක් පාළි අට්ඨකථාවලින්

පවා සොයා ගත හැකි බව ආචාර්‍ය අදිකාරම් විසින් පෙන්වා දී ඇත.[14]

මේ අන්දමින් සකස්කර ගනු ලබන ගෞතම බුද්ධ චරිතය පුරාවිද්‍යාවෙන් තව දුරටත් තහවුරු වෙයි. ගෞතම බුදුන්ගේ යයි සලකනු ලබන ශරීර ධාතු සමහරක්, ධාතු කරඬුවක නිධන් කොට තිබී, 1898 දී පිප්‍රාවහි කරන ලද පුරාවිද්‍යාත්මක ගවේෂණවල දී සමුවින.[15] මේ ධාතු කරඬුවෙහි කොටා ඇති ලිපියෙහි සඳහන් පරිදි, මේ සර්වඥ ධාතු එහි තැන්පත් කරන ලද්දේ සාක්‍යයන් විසිනි. බුදුන් කුසිනාරා නුවර දී පිරිනිවන් පෑමෙන් පසුව, උන්වහන්සේගේ ශාරීරික ධාතු ලබා ගැනීම පිණිස අරගලයක් ඇති වූ බවක් කියනු ලැබේ. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඒ ධාතු සමූහය, රජවරුන් අට දෙනෙකු අතර සමසමව බෙදා හරින ලදුව, ඒ එක් එක් රජු විසින් මේ ධාතු නිධන්ගත කොට ස්තූප ඉදි කරන ලද බව කියනු ලැබේ. මේ අට පංගුවෙන් එක් කොටසක් සාක්‍ය රජවරුන් විසින් තම අගනුවර වූ කපිලවස්තු පුරයට ගෙනෙන ලදී. පිප්‍රාව කරඬුවෙහි තිබී සමුවූ මේ සර්වඥ ධාතු යයි බොහෝ පුරාවිද්‍යාඥයන් අනුමාන කරන්නේ ඒ සොයාගැනීම බෞද්ධ සාහිත්‍යයෙහි එන මේ ප්‍රවෘත්තිය හා සැසඳෙන නිසා ය.[6]

මේ හැරුනු විට බුද්ධ චරිතය හා සම්බන්ධ වූ ස්ථාන කිපයක් ම පුරාවිද්‍යාඥයින් විසින් නිසැක ලෙස හඳුනා ගෙන ඇත. සිද්ධාර්ථ කුමාරයන්ගේ උපත සිදුවූ බිම වශයෙන් සලකනු ලබන ලුම්බිනිය වර්තමානයෙහි ''රුම්මින්දේයි'' නමින් හැඳින්වෙන නගරය වෙයි. ක්‍රි.ව. යට තෙවැනි සියවසෙහි ''ලුම්බිනි ගාම'' නමින් හැඳින්වුණු මේ ස්ථානයට අසෝක රජතුමා පැමිණුනේ සාක්‍ය මුනිඳා මෙහි උපන් නිසා (''හිදබුද්ධෙ ජාතෙ)'' බව රජතුමා විසින් එහි නංවන ලද අසෝක ස්ථම්භයෙහි පිහිටුවන ලද ටැම් ලිපියෙන් අනාවරණය වෙයි:

> ''දෙවාන පියෙන පියදසින ලාජින වීසති වසාභිසිතෙන අතන ආගාව මහීතෙ හිද බුධෙ ජාතෙ සක්‍යමුනීති.
> ..... ලුම්මිනි ගාමෙ .....''[17]
> (ශාක්‍යමුනි වූ බුදුන් මෙහි ඉපදුනු නිසා දෙවන පිය පියදස් (අශොක) රජ තුමා මෙහි ඇවිත් වන්දනමානන කළේ ය.)

පැරණි ලුම්බිනියට නුදුරින් වූ කපිලවස්තු පුරය, අද පිප්‍රාවා නමින් හැඳින්වෙන ගම වටා ඇති ප්‍රදේශය ලෙසින් පුරාවිද්‍යාඥයෝ පවසති.[18] හිමාලය කඳුවැටිය පාමුල බරණැසට සැතපුම් සියයක් පමණ ඊසාන දිගින් පිහිටි මේ ප්‍රදේශය, නෂ්ටාවශෙෂයන්ගෙන් ගහනව තිබෙන හෙයිනුත් පිප්‍රාවා ලිපියෙන් සනාථවන බැවිනුත්, බුදුන් එදා සැරිසැරූ කපිලවස්තු ප්‍රදේශය හැටියට සැලකිය හැකි ය. එසේ ම බුදුන් අවසන් හුස්ම හෙලූ කුසිනාරා නුවර, අද ''කාසියා'' යනුවෙන් හැඳින්වෙන නගරය බව තීරණය කොට ඇත. මේ අයුරු පුරාවිද්‍යාත්මක සාධකවලින් ද තහවුරු වන ගෞතම බුදුන්ගේ චරිතය හුදු පුරාණොක්තියක් හෝ දේවකථාවක් හෝ වශයෙන් බැහැර කළ නොහෙන බව පැහැදිලි ය.

කෙසේ වුව ද, ගෞතම බුදුහු, බෞද්ධ සාහිත්‍යයෙහි පැනෙන එක ම බුදුවරයා නොවේ. ඔහු හැඳින්විය යුත්තේ මෙතෙක් පහළ වී සිටින බුදුවරයින් අතුරෙහි අවසාන බුදුවරයා හැටියට ය. වජ්‍රයාන කෘතියක් වූ ''සාධනමාලාවෙහි'' එතුමා ගැන සඳහන් කොට ඇත්තේ ''වජ්‍රාසන බුද්ධ'' යන නමිනි.[19] අද විද්‍යමාන වන මහායානික බුදු පිළිම හා කැටයම් අතර දක්නට නොලැබෙන නමුදු ''දුර්ගතිපරිශොධන'' නමින් ද හැඳින්වෙන ගෞතම බුද්ධ රූපයක් ගැන තවත් වජ්‍රයාන ග්‍රන්ථයක් වූ ''නිෂ්පන්නයෝගාවලියෙහි'' සඳහන් වේ.[20]

ගෞතම බුදුන් මෙතෙක් ලොව උපන් බුදුවරයින් අතුරින් අවසානයා වුව ද, බුද්ධ වංශයෙහි අවසානයා නොවන බව පාළි සාහිත්‍යයෙන් පෙනේ.[21] ''මෙත්තෙය්‍ය'' නමින් අනාගතයෙහි දී ප්‍රකට වන මතු බුදුවරයකු පිළිබඳ තොරතුරු චක්කවත්ති-සිහනාද සූත්‍රයෙහිත්, අනාගතවංශයෙහිත් සඳහන් වී තිබේ. මහායානිකයන් මොහු හඳුන්වන්නේ ''මෛත්‍රිය බොධිසත්ව'' යන නමිනි.

මානුෂී බුද්ධ

මහායානිකයන්ගේ අදහස අනුව, ගෞතම බුදුහු ''මානුෂී බුද්ධ'' නමින් ගැනෙන බුද්ධවංශයට අයත් වෙති. මේ බුද්ධවංශය ''මානුෂී'' යන විශෙෂ නාමයකින් හඳුන්වන ලද්දේ, ඒ බුදුවරුන් මහායානයෙහි එන ''ධ්‍යානි බුද්ධ'' පරම්පරාවෙන් වෙන්කොට හඳුනා ගැනීම පිණිස ය. පළමු කී බුදුවරයින්ට ''මානුෂී බුද්ධ'' යන නාමය දෙන ලද්දේ ඔවුන් ''ධ්‍යානි'' බුදුවරයින් මෙන් හුදු කල්පිත නිර්මාණයන් නොව, කලින් කල මිනිස් වෙසින් ලොව උපදින සම්මා සම්බුදුවරයින් වන බැවිනි.

ත්‍රිපිටකයට ඇතුළත් ආදිතම ග්‍රන්ථවල දක්වෙන්නේ ''මානුෂී'' හෙවත් ''සබ්බඤ්ඤූ'' බුදුවරයින් සත් දෙනෙකු පිළිබඳ පුවත් පමණි.[22] ගෞතම බුදුන් දක්වා විහිදී ආ මේ බුද්ධවංශයට අයත් බුදුවරයින් සත් දෙනාගේ ම චරිතාපදානද, දීඝනිකායෙහි දක්වා තිබේ.[23] ආදිම බෞද්ධයින්

දැන සිටි බුද්ධ වංශය, බුදුවරයින් සත් දෙනෙකුගෙන් පමණක් පරිමිත වූවක් බව ත්‍රිපිටකයට අයත් ආදිතම ග්‍රන්ථයන්ගෙන් මෙන් ම පුරාවිද්‍යාවෙන් ද සනාථ වන්නකි. ක්‍රි. ව. යට දෙවැනි සියවසෙහි පමණ කරන ලද භාරුන් කැටයම් අතර, මේ එක් එක් බුදුවරයින්ට අභිසම්බොධිය ලබා ගැනීමට පිහිට වූ බොධිවෘක්ෂ සතෙහි රූප නෙලා තිබේ.[24] මේ කැටයම් සමඟ ඔවුන්ගේ නම් ද කොටා තිබීම මේ සම්බන්ධයෙන් ඉතා වැදගත් පුරාවිද්‍යාත්මක සාක්ෂ්‍යයන් වශයෙන් සැලකිය හැකි ය. ක්‍රි.ව. පෙර ප්‍රචලිතව පැවැති බ්‍රාහ්මී අක්ෂරයෙන් ලියන ලද ඒ කෙටි සෙල්ලිපිවල මේ සත් බුදුවරයින්ගේ නම් සඳහන් කොට ඇත්තේ මේ අන්දමිනි.[25]

විපසි (විපස්සි), සිඟ (සිඛි), සෙසභූ (වෙස්සභූ), **කකුසඛ** (කකුසන්ධ), කොනාගමන (කොණාගමන), කාසප (කස්සප), සාකමුනි (සාක්‍යමුනි).

ක්‍රිස්තු වර්ෂයට යට දෙවැනි සියවසට අයත් යයි පුරාවිද්‍යාඥයන් නිර්ණය කොට ඇති සාංචියේ නැගෙනහිර වාහල්කඩෙහි ද ඇත්තේ මේ එක් එක් බුදුරජුන්ට අයත් බොධිවෘක්ෂ සතෙහි රූප පමණි.[26] එහෙත් බුදු සමය පොදු ජනයා අතර වඩ වඩාත් පැතිරෙත් ම, මානුෂී බුද්ධවංශයෙහි සමාරම්භය ද ක්‍රමයෙන් අනාදිමත් අතීතයක් කරා දිවෙන සැටි දක්නට ලැබේ. මෙතෙක් කල් බෞද්ධයින් දැන සිටි බුද්ධවංශයෙහි ආදිතමයා විපස්සි බුදුවරයා වුව ද දැන් ඔහුටත් පෙරාතුව සිටි බුදුවරයින් පිළිබඳ කථාවස්තු ද ක්‍රමයෙන් බෞද්ධ සාහිත්‍යයට පිවිසෙන්නට වන. ජෙන සාහිත්‍යයෙහි සඳහන් වන පරිදි, මහාවීර, ඔහුට පෙර පහළ වූ තීර්ථංකරයින් සූවිසි දෙනෙකුගෙන් යුත් පරම්පරාවක අවසානයා වේ. ඇතැම් විට, මේ අදහස් ඟුරු තන්හි තුබ්බාගත් බෞද්ධයින් ගෞතම ශාක්‍යමුනිහු ද බුදුවරයින් සූවිසි දෙනෙකුගෙන් අනතුරුව පහළවූවකු ලෙස දැක්වීමට වෑයම් කළා විය හැකි ය.

පාළි ත්‍රිපිටකයෙහි සූවිසි බුදුවරයින් ගැන විස්තරව සඳහන් වන්නේ බුද්දක නිකායට අයත් 'බුද්ධවංශ' නමැති පාළි ග්‍රන්ථයෙහි ය. සූවිසි බුදුවරයින් පිළිබඳව සිංහල බෞද්ධයින් අතර අද ප්‍රචලිතව පවත්නා වෘත්තාන්තයෙහි මූලාරම්භය ද මෙම ''බුද්ධවංශ'' කාව්‍යය දක්වා දිවෙයි. විපස්සි බුදුන්ට [illegible] බුදුවරයින්ගේ නම් ''බුද්ධවංශය'' [illegible] සඳහන් කරයි.

දීපංකර, කොණ්ඩඤ්ඤ, මංගල, සුමනස, රේවත, සොභිත; අනොමදස්සි, පදුම, නාරද, පදුමුත්තර සුමේධ, සුජාත, පියදස්සි, අත්ථදස්සි, ධම්මදස්සි, සිද්ධාත්ථ, තිස්ස, ඵුස්ස.

මෙයින් නොවතින බුද්ධවංශකරුවා, දීපංකර බුදුන්ටත් ඔබබෙහි ද සිටි බුදුවරයින් තිදෙනෙකු ගැන – තණ්හංකර, මේධංකර හා සරණංකර – එහි විසි හත්වැනි පරිච්ඡේදයෙහි සඳහන් කොට ඇති බව මහාචාර්‍ය මලලසේකර පවසයි.[27] මේ බුදුවරයින් තිදෙන පිළිබඳ පුවත, බෞද්ධයින් ජෙනයින් ද පසුබා යන්නට දරන ලද උත්සාහයකැයි ද අනුමාන කළ හැකි ය.

මහායානිකයන් අතර වඩාත් ප්‍රසිද්ධියට පත්ව ඇත්තේ අන්තිමට පහළ වූ බුදුවරයින් සත් දෙනා පමණක් වුව ද, මානුෂී බුදුවරයින් දෙතිසක පමණ නම් මහායාන ග්‍රන්ථ ආශ්‍රයෙන් සොයා ගත හැකි යයි භට්ටාචාර්ය කියයි.[28] සංස්කෘත බෞද්ධ කාව්‍යයක් වන ලලිතවිස්තරයෙහි මේ බුද්ධ සංඛ්‍යාව සූපණස දක්වා වැඩිවී තිබේ. මෙසේ දික්වෙමින් ආ බුද්ධ පරම්පරාව සියයකටත් අධික බුදුවරයින්ගෙන් සැදුනක් ලෙසට 'මහාවස්තු' කරුවා දක්වයි. එහෙත් මේ බුදුවරු සියලු දෙනා ම ගෞතම සාක්‍යමුනිවරයන් මෙන්, ඓතිහාසික පුද්ගලයන් වී ද කිව නොහැකි ය. ඔවුන් සැබෑ පුද්ගලයින් යයි නිගමනය කිරීමට තුඩු දෙන කිසිදු සාධකයක් මෙතෙක් ලැබී නැත.

ධ්‍යානි බුද්ධ හා ආදි බුද්ධ

මානුෂී බුදුවරයින් හැරුනු විට ''ධ්‍යානි බුද්ධ'' නමින් ප්‍රකට තවත් බුද්ධ කොට්ඨාශයක් මහායානයෙහි දක්නා ලැබේ. මේ ධ්‍යානි බුදුවරයින්ගේ උපතත්, ඔවුන් පළට කරන සංකේතාත්මක අර්ථයක් පිළිබඳ විෂයූන් විසින් ඉදිරිපත් කොට ඇති මත විවිධ ය.

ධ්‍යානි බුද්ධ වාදයෙහි ප්‍රභවය, දේවත්වාරොපණය කිරීමට මහයාන බෞද්ධයින් තුළ උපන් අධික ළැදිකමෙහි ප්‍රතිඵලයක් වශයෙන් සැලකිය හැකි ය. හීනයානිකයන්ට අපූරුවක් වූ ධ්‍යානිබුද්ධවාදය, මහයානිකයන් අතර ද ජනප්‍රිය භාවයට පත්වූයේ වජ්‍රයානයෙහි නැඟීමත්, ව්‍යාප්තියත් සමඟ ය. සෑම වස්තුවක් ම පාහේ දේවත්වයෙන් පිදීමට බලවත් අභිරුචියක් දැක්වූ වජ්‍රයානිකයෝ ගෞතම බුදුන් පමණක් නොව, ඔහු විසින් දේශනා කරන ලද ඇතැම් ධර්ම කොට්ඨාශ ද දේවත්වයට නඟා පුදන්නට වූහ.

මේ ධ්‍යානි බුදුවරයින් ගැන ප්‍රථම වරට සඳහන් වන්නේ ''ගුහ්‍යසමාජ'' නමැති වජ්‍රයාන බෞද්ධ ග්‍රන්ථයෙහි ය.[29] එහි දැක්වෙන පරිදි, ධ්‍යානි බුදුවරයෝ පස් දෙනෙකි. වෛරොචන, රත්නසම්භව, අමිතාභ, අමෝඝසිද්ධි හා ආක්ෂොභ්‍ය යන නම්වලින් හඳුන්වනු ලබන මොවුන්, බුදු දහමෙහි උගන්වන ස්කන්ධ පඤ්චකය රූපකායට

නැඟීමක් ලෙස සම්හරු සලකති.[30] බෞද්ධ දර්ශනිකයන් ''මිනිසා'' යන පදය විවරණය, කරන්නේ, රූප — වේදනා — සංඥා — සංස්කාර හා විඥාන යන පඤ්ච ස්කන්ධයෙහි එක්වීමක් හැටියට ය. මේ පස, එකින් එක ගෙන දේවත්වයට නැඟූ වජ්රයානිකයෝ ''ධ්‍යානිබුද්ධ'' මණ්ඩලය බිහි කළහ. ධ්‍යානි බුදුවරයින්ගේ උපත සෙවූ වෙනත් පඬිවරු මෙයට වඩා වෙනස් නිගමනවලට එළඹුනහ. ඔවුන් කියන හැටියට්, ධ්‍යානිබුද්ධ මණ්ඩලය නිර්මාණය කරන ලද්දේ ''බුද්ධත්වය''ට අයත් විවිධ ලක්ෂණවලට දේවත්වය ආරෝපණය කිරීමෙනි. මේ බව, ධ්‍යානි බුදුවරයන්ට සඳහා යොදන නාමයන්ගේ අර්ථ සලකා බැලීමෙන් වැටහේ. ''අමිතාභ'' යනු අප්‍රමාණ ආලෝකය යන අර්ථය ගෙන දෙන පදයකි. මේය බුද්ධත්වයෙහි ඒක ගුණාංගයක් වශයෙන් සැලකූ වජ්රයානිකයෝ ඊට කිසියම් රූපාකාරයක් ආරූඪ කොට ''අමිතාභ'' නමැති ධ්‍යානි බුදුවරයා නිර්මාණය කළහ. ''අක්ෂොභ්‍ය'' යනි පදයේ, ඉන්ද්‍රියාදීන්ගේ ස්වභාවය ඇත්තේ ය යන අරුත් දෙයි. මෙයාකාරයෙන් සලකා බලන විට, ධ්‍යානි බුදුවරයින් පස් දෙනාගෙන් මී ප්‍රකාශ වන්නේ බුද්ධත්වයෙහි ගුණාංග සමූහයක් බව පැහැදිලි වේ.

මේ ධ්‍යානි බුදුවරයින් පිළිබඳ අදහස, පසුකලක දී එක්තරා වෙනසකට භාජන විය. එනම්, සවැනි බුදුවරයෙක් වී එක්වීමයි. ඔහු මහායාන ග්‍රන්ථවල හිඳුන්වා දී ඇත්තේ මෛත්‍රේය යන නමිනි. පඤ්ච ස්කන්ධය ඒකකයක් විශ්‍රයෙන් ගෙන, එය ද යළින් රූපකායට නැඟීමෙන් බිහි කරන ලද බුදුවරයෙකු ලෙසිනි, ඇතැම් විචාරකයින් මොහු නිරූපණය කරන්නේ.[31]

වජ්රයානිකයින් විසින් පරම සුඛය වශයෙන් දක්වන ''ශූන්‍යතාව'' බෙදා වෙන් කොට නොගන්නක් බැවින් ''බුද්ධත්වය'' මේසේ වෙන් කොට දැක්වීම, ඔවුන්ගේ දර්ශනය හා නොසැසඳෙන බව ඔවුන්ට පසු කලක දී අවබෝධ වන්නට ඇත. ධ්‍යානි බුදුවරයින් පස් දෙනකු හෝ හඳෙනකු හෝ සිටීම නිසා වජ්රයානය බහු බුද්ධවාදයක් බවට පත්විය. එබැවින් ඔව්හු නැවතත් එක බුදුවරයෙකුගේ ප්‍රමුඛත්වයකින් යුත් බුද්ධ මණ්ඩලයක් නිර්මාණය කරන්නට සිතූහ. ''ආදි බුද්ධ'' හෙවත් ''පරමාදිබුද්ධ'' පිළිබඳ අදහස, මේ උත්සාහය නිසා ඇතිවූවකි. මේ අදහස පළමුවෙන් ම ඉදිරිපත් කරන ලද්දේ, දහවැනි සියවසෙහි දී පමණ නාලන්දවෙහි සිටි වජ්රයාන භික්ෂූන් විසිනැයි සැලකේ. ''ශූන්‍යතාවේ'' මූර්තියක් ලෙස හැඳින්වෙන ''ආදි බුදුවරයා'' ධ්‍යානි බුදුවරයින්ගේ ද නිර්මාතෘවරයා බවට පත්කරනු ලැබිණි. මොහුට ''වජ්රධර'' යන නාමය ද ව්‍යවහාර වේ.

ආදි බුද්ධ වාදය, හින්දු සමයෙහි දැක්වෙන ජගත් නිර්මාතෘවරයා වූ බ්‍රහ්මයා පිළිබඳ අදහස්වලට අනුරූපව සකස් කරන ලද්දකැයි La Vallee Poussin මහතා සඳහන් කරයි.[32] ''පුරමාදි'' බුදුවරයින් හැඳින්වීම පිණිස යොදනු ලබන ස්වයම්භූ ලොකනාථ, ස්වයම්භූ සම්භූ හා ආදිනාථ වැනි විරුදනාම, වජ්රයානයත් හින්දු සමයත් අතර ඇති මේ අන්‍යොන්‍ය සම්බන්ධතාව වැඩි දුරටත් හෙළි කරයි. නොයෙක් වෙසින් පෙනී සිටීමට තරම් ශක්තියක් ආදි බුදුවරයා සතු හෙයින්, ''විශ්වරූප'' යන නමක් ද ඇතැම් විට ඔහු සඳහා ව්‍යවහාර කරනු ලබන බව හොඟ්සන් කියයි.[33]

ආදි හීනයානිකයන් එක්තරා පරිමිත අර්ථයකින් වහරනු ලැබූ ''බුද්ධ'' යන පදය මහායානිකයන් අතින් ක්‍රමයෙන් පළල් වී පැතිරී ගිය ආකාරය මේ කරුණුවලින් පැහැදිලි වෙයි.

හින්දු සමය, තවත් අංශයකින්, ''බුද්ධ'' යන පදයෙහි අර්ථය කෙරෙහි බලපාන්නට වූ බව පෙනෙයි. එසේ වූයේ බුදුහුත් විෂ්ණුගේ දස අවතාරයන්ගෙන් එකක් ලෙස ඇතැම්හු සලකන්නට වූ හෙයිනි. එතෙක් හඳුනා ගැනුණු විෂ්ණුගේ දසාවතාරයන්ට අනුබෙහි ලා සැලකීමෙන් බුදුන් වෙති. මේ සම්බන්ධයෙන් අනුව වටිනා සාධක ලබා ගත හැකි විය යුත්තේ ''පුරාණ'' ග්‍රන්ථයන්ගෙන් වුව ද, ඉන් අපට ලැබෙන පිටිවහල අල්ප ය. ''පුරාණ'' ග්‍රන්ථයන්ගෙන් එළිවිය හැකි සාධක ඇත්ත විශ්වයෙන් මේ මතුහෙදය තව දුරටත් නහවුරු කරනු විනා ඒකමතික තීරණයකට එළඹීමට අනුබල නොදෙයි.[34] කෙසේ වුව ද, විෂ්ණුගේ එක් අවතාරයක් හැටියට බුදුන් සඳහන් කරන අවස්ථාවල, ඉන් අභිප්‍රේත වූයේ ගෞතමසාක්‍ය මුනිවරයන් යයි සිතිය හැකි ය.

පුරාවිද්‍යා ඥයා හා කලා විචාරකයා ''බුදු පිළිමය'' යන පදය භාවිතා කරන විට, ''බුද්ධ'' යන පදයට ආරොපණය කරන අර්ථ ප්‍රභේද මෙසේ විවිධත්වයෙන් යුක්ත වේ.

ආශ්‍රිත ග්‍රන්ථ හා ලිපි

1. මහා නිද්දේසපාළි: සාරිපුත්ත නිද්දෙසො, (බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා පි. 646 — 47)
2. එම.
3. මනොරථපූරණිය :1.20
4. Nivedita and Coomaraswamy: Myths of the Hindus and Buddhists. p.245
5. Anesaki: Docetism (Buddhist), Hasting's Encyclopaedia of Religion and Ethics: Vol. 4 p. 835

6. එම පි. 836
7. Adikaram: Early History of Buddhism in Ceylon. p. 96
8. Thomas: The Life of Buddha as Legend and History.
9. Geiger: The Mahavamsa. Introduction XXIV
11. ඇගේ නාමය පාළි සාහිත්‍යයෙහි නන් අයුරින් දක්වා තිබේ. බිම්බා, බිම්බාසුන්දරී, භද්දකච්චානා, ගොපා, රාහුලමාතා යනාදි වශයෙනි.
10. Malalasekera: Dictionary of Pali Proper Names. p. 295
12. Geiger: The Mahavamsa. Introduction. XXIV
13. සංයුක්ත නිකාය : ජරා සූත්‍රය
14. Adikaram: Early History of Buddhism in Ceylon. p. 96
16. පිප්‍රාවා ලිපිය වෙනත් ආකාරයකට විවරණය කරන ප්ලීට් මහතා මේ මතය අනුමත නොකරයි. Fleet: The Inscription on the Piprava vase JRAS (GB) 1906 p. 149.
17. Hultzsch: Corpus Inscriptionum Indicarum. Vol 1. Inscriptions of Asoka: p. 164
18. Vost: Identifications in the Region of Kapilavastu. JRAS (GB) 1906. p. 553
19. Bhattacharyya: Indian Buddhist Iconography. p. 77
20. එම.
21. පූජාවලියෙහි එන විවරණ මහුල් පූජා කථා නමිවූ තුන්වැනි පරිච්ඡේදයත්, සද්ධර්මරත්නාවලියෙහි සුවිසි විවරණය නමිවූ පරිච්ඡේදයත් බලන්න.
22. Malalasekera: DPPS. Vol. 2. p. 295
23. දීඝ නිකාය : 11.5
24. Cunningham: Barhut Stupa
25. Barua and Sinha: Barhut Inscriptions p. 39
26. Grunwedel: Buddhist Art in India. p. 74
27. Malalasekera. DPPS. Vol 2. p. 295
28. Bhattacharyya: Indian Buddhist Iconography. p. 76
29. එම.
30. එම.
31. එම.
32. La Vallee Poussin: Adi Buddha. ERE Vol. 1. p. 94
33. Hodgson: Essays on the Language, Literature and Religion of Nepal and Tibet. p. 83
34. Rao: Hindu Iconography p. 216